৬ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2333/25 – 2023 මැයි මස 25 වැනි බ්‍රහස්පතින්දා – 2023.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 100 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2022/CEB/166.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DS/MN/LB/05/AQ/WPP/Ph1.Ext/33.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 අප්‍රේල් මස 19 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.** – ප්‍රාදේශීය ලේකම්, මන්නාරම නගරය.

2. **ඉඩමේ විස්තරය.** – උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක MN/55, පේසාලෙයි බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වියයාඩිප්පන්නෙ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MN/MNN/2023/15 හා 2023.02.28 දිනැති ප්‍රගමන අනුරේඛණයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – වියයාඩිප්පන්නෙකානි – ප්‍රමාණය: හෙක්. 0.0240**

උතුරට: (හිමිකම් කියන්නා නොදත්) වියයාඩිප්පන්නෙකානි; නැගෙනහිරට: (හිමිකම් කියන්නා නොදත්) වියයාඩිප්පන් -නෙකානි; දකුණට: අරෝකියම් ඇලෝසියස් ඩයස්වියයාඩිප්පන්නෙකානි සහ (හිමිකම් කියන්නා නොදත්) වියයාඩිප්පන්නෙකානි; බටහිරට: (හිමිකම් කියන්නා නොදත්) වියයාඩිප්පන්නෙකානි.

EOG05 - 0224

1A – G 039579 – 24 (2023/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 91 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2022/CEB/140.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DS/MN/LB/05/AQ/WPP/Ph1.Ext/10.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 අප්‍රේල් මස 19 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි. –** ප්‍රාදේශීය ලේකම්, මන්නාරම නගරය.

2. **ඉඩමේ විස්තරය. –** උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක MN/62, තොඩ්ඩවේලි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තොඩ්ඩවේලි ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක MN/MNN/2022/311 හා 2023.02.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – කුරුසඩිකානි – ප්‍රමාණය: හෙක්. 0.9117**

උතුරට: (හිමිකම් කියන්නා නොදත්) කුරුසඩිකානි; නැගෙනහිරට: කැබලි අක්ෂර B සහ C; දකුණට: කැබලි අක්ෂර C සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ (හිමිකම් කියන්නා නොදත්) කුරුසඩිකානි.

02. **කැබලි අක්ෂර 'B' – කුරුසඩිකානි – ප්‍රමාණය: හෙක්. 0.8787**

උතුරට: කැබලි අක්ෂර A සහ (හිමිකම් කියන්නා නොදත්) කුරුසඩිකානි; නැගෙනහිරට: (හිමිකම් කියන්නා නොදත්) කුරුසඩිකානි; දකුණට: (හිමිකම් කියන්නා නොදත්) කුරුසඩිකානි, මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ කැබලි අක්ෂර C; බටහිරට: කැබලි අක්ෂර C සහ A.

03. **කැබලි අක්ෂර 'C' – කුරුසඩිකානි – ප්‍රමාණය: හෙක්. 0.7729**

උතුරට: කැබලි අක්ෂර A සහ B; නැගෙනහිරට: කැබලි අක්ෂර B; දකුණට: කැබලි අක්ෂර B සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ කැබලි අක්ෂර A.

EOG05 - 0225

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.